# අප අවට සත්තු

## 5 ශ්‍රේණිය

## 4 වන පාඩම

සතුන් යනු පරිසරයේ ම කොටසකි. ඔවුන් තුළ විවිධ චර්යාවන් දක්නට ලැබෙන අතර එම චර්යාවන් තුළින් මිනිසාට උගත හැකි එමෙන් ම මිනිසා හා සතුන් අතර පවත්නා අන්තර් සබඳතාව, පරිසරයේ සමතුලිතතාව රැක ගැනීමට බෙහෙවින් ම දායක වේ.

❖ අප අවට පරිසරයේ වෙසෙන සතුන් කිහිපදෙනෙකු ඇඳ නම් කරන්න.

අවට පරිසරයේ සතුන් විවිධ අයුරින් කාණ්ඩ වශයෙන් වෙන් කළ හැක.

උදා :- ක්ෂීරපායින් (කිරි බී වැඩෙන්නන්), පක්ෂීන්, මත්ස්‍යයන්.........

ගොඩබිම/ජලයේ/වායව පරිසරයේ වෙසෙන සතුන්.

### <u>සතුන්ගේ පැවැත්ම සඳහා ඉවහල් වන ශාරිරික ලක්ෂණ.</u>




පක්ෂීහු - පියෑඹීම සඳහා පිහාටු තිබීම.

මත්ස්‍යයෝ - පිහිනීම සඳහා වරල් තිබීම.

පූසා - ගොදුරු සොයා ගැනීමට රැවුල් කෙඳි තිබීම.

හූනා - පෘෂ්ටයකට ඇලී සිටිමට විශේෂ පාද සහිත වීම.



කටුස්සා - ආරක්ෂාව පිණිස සමේ වර්ණය වෙනස් කිරීම.

හැකරැල්ලා - අනතුරක දී ශරීරය හකුළා ගැනීම.

ඉබ්බා - කටුව තුළට රිංගා ගැනීම.



(මින් සතුන් කිහිපදෙනෙකුගේ පින්තූර ඇතුළත් කරන්න.)

❖ දරුවනි, විවිධාකාරයට වර්ගීකරණය කරන ලද සතුන්ගේ පින්තූර වැඩැහිටි අයගේ උදවු ඇතිව අන්තර්ජාලය ඔස්සේ නැරඹීමට යොමු වන්න.

සතුන් මඟින් මිනිසාට සහ මිනිසා මඟින් සතුන්ට ලැබෙන දේවල් සහ වාසිදායක තත්ත්වයන් පිළිබඳ විමසා බලමු.

| මිනිසා මඟින් සතුන්ට ලැබෙන දේ | සතුන් මඟින් මිනිසාට ලැබෙන දේ |
|---|---|
| ■ ආහාරපාන ලබාදීම.<br>■ ඖෂධ ලබාදීම.<br>■ ආරක්ෂාව සැපයීම. (අභයභූමි නිර්මාණය මඟින්)<br>■ නිවස රැකබලා ගැනීම, ආදරය කරුණාව ලබාදීම<br>(බල්ලා, පූසා)<br>■ වාසස්ථාන ලබාදීම.<br>■ පිරිසිදු කිරීම.<br>■ පලතුරු/ විශාල ගස් රෝපණය. | ■ ආහාර ලබාදීම.<br>■ ආර්ථික වාසි ලබාදීම.<br>■ ආරක්ෂාව සැපයීම.<br>■ ආරක්ෂක සේවා සඳහා උදවු කිරීම.<br>■ පරිසරය අලංකාර කිරීම.<br>■ මානසික සුවය ලබාදීම.<br>■ විනෝදාස්වාදය ලබාදීම.<br>■ ඖෂධ ලබාදීම.<br>■ පරිසරය පවිත්‍ර කිරීම.<br>■ කුණු කසළ කා දැමීම.<br>■ වගාවන් ආරක්ෂා කිරීමට උදවු වීම.<br>■ පොහොර ලබාදීම.<br>■ මල් පරාගනයට දායකවීම.<br>■ බීජ ව්‍යාප්තියට උදවු වීම. |

ඉහත වගුවට අනුව සතුන් නිසා මිනිසාට ඇති වන වාසිදායක තත්ත්වයන් බහුල ය. පරිසරයේ සමතුලිත බව පවත්වා ගැනීමට සෑම සතෙකුගේ ම පැවැත්ම වැදගත් වේ.

## <u>ගන්නා ආහාර අනුව සතුන් වර්ග කරමු.</u>

| ශාක භක්ෂක | මාංශ භක්ෂක | සර්ව භක්ෂක |
|---|---|---|
| එළුවා | බත්කූරා | කුකුළා |
| ගවයා | නරියා | බල්ලා |
| හාවා | කොටියා | කපුටා |
| මුවා | සිංහයා | |

ඉහත වගුව දෙස බැලීමෙන් අපට පැහැදිලි වන කරුණක් නම් පරිසරයේ සමතුලිතතාව රැක ගැනීමට සතුන් ආහාර ගන්නා ආකාරය කෙතරම් වැදගත් ද යන්න යි.

ශාක භක්ෂක සතුන් පමණක් පරිසරයේ සිටිත් නම්,

මාංශ භක්ෂක සතුන් පමණක් පරිසරයේ සිටිත් නම්,

කුමක් සිදුවේ ද යන්න පිළිබඳ සිතා බලන්න.

සත්ත්ව ලෝකයේ මෙම කොටස් තුනට ම අදාළ සතුන් වාසය කරන අතර එය පරිසරයේ සමතුලිත බව රැක ගැනීමට හේතු වේ.

මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් නිසා ශාක හා සත්ත්ව කොට්ඨාශයන්ට සිදුවන හානි බොහෝ ය.

- ගස් කැපීම/ කැලෑ එළිකිරීම.
- වැලි ගොඩ දැමීම.
- සතුන් දඩයම් කිරිම.
- පහත් බිම් ගොඩ කිරිම.
- වනාන්තර තුළ අනවසර ඉදිකිරීම් සිදුකිරීම.
- වනාන්තර ගිනි තැබීම.
- අවධිමත් ලෙස කෘමිනාශක, රසායන පොහොර වර්ග භාවිතය.
- මිනිසාගේ වෙනත් ක්‍රියාකාරකම්.

මෙවැනි ක්‍රියාකාරකම් හේතුවෙන් ජෛව පද්ධතියට ම හානි සිදු වේ. ඒ නිසා මෙයින් වැළකීම ඉතා වැදගත් ය.

ශ්‍රී ලංකාවට ආවේණික මෙන්ම ආවේණික නොවන සතුන් ද ඇත.

ශ්‍රී ලංකාවට ආවේණික සතුන්.

ජන්මයෙන්ම ශ්‍රී ලංකාවට ආවේණික සතුන් ශ්‍රී ලංකාවේ ඒකදේශික සතුන් වේ.

උදා :- පක්ෂීහු - වලි කුකුළා, හබන් කුකුළා

ක්ෂීරපායිහු - කළු වඳුරා, කලවැද්දා, හික්මීයා

මත්ස්‍යායින් - බූලත්හපයා, මල් පුළුට්ටා

උරගයෝ - යක් කටුස්සා, දියනයා

මෙම ඒකදේශික සතුන් රටට උරුමයක් වන අතර එම සතුන් ආරක්ෂා කරමින් රැක බලා ගැනීම අපගේ යුතුකමකි.

සතුන් තුළ පවතින ඇතැම් ගුණාංග මඟින් ලබාගත හැකි ආදර්ශ.

- සාමූහිකබව.
- එකිනෙකාට පිහිට වීම.

❖ සතුන් සම්බන්ධව ඇති පහත ගීත සොයා ලියන්න.

1. බැරි බර කරේ තියන් - දෙපයට වාරු අරන්
   අපෙ බඩ කට පුරවනවා
   රෑ සී පද කියමින් - සීතලයට ගැහෙමින්
   හපුතලෙ කන්ද නඟිනවා
   (ගායනය - මැක්සි ජයවීර)

2. යාල යාල යාල යන්න සතුන් බලන්න - ඇගේ පතේ වෙහෙස නිවා විනෝද වන්න
   (ගායනය - ශ්‍රෙන් ලෙනාඩෝස්)

3. බෝල බෝල මැටි එක එක ගේනවා
   (ගායනය - එම්.එස්. ප්‍රනාන්දු)

4. ගමන බිමන හරි කඩිසර - ඔසවාගෙන යයි බැරි බර
   (ගායනය - ෆ්‍රෙඩී සිල්වා)

5. පාන්කිරිත්තා තක්කිට තරිකිට - උඩ පැන පැන නටතෙයි
   (ගායනය - ෆ්‍රෙඩී සිල්වා)

- ❖ සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය ඇසුරෙන් අශ්වයෙකුගේ ගමන් විලාසය සහිත තුරඟා වන්නම.

  තත් තත් තනත් තනෙන - තත් තත් තනත් තනෙන

  සත් වෙත් මහත් අදර - ලත් යුත් සිදත් කුමරු

- ❖ හාවාගේ ගමන් විලාසය සහිත මුසලඩි වන්නම.


  වනපැත්ත බියපත්ව සයනම් // දුටත් යනෙන විටත් දුවන......

ක්‍රියාකාරකම 6.


- අප අවට සතුන් පිළිබඳ විවිධ මාධ්‍ය භාවිතා කරමින් නිර්මාණ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන්ගේ රුචිකත්වය අනුව හා කුසලතාවය අනුව කැමති සතෙකු නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන ඒමට සිසුන් යොමු කරන්න.
- තමා රැගෙන ආ ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් විවිධ සතුන් නිර්මාණය කිරිමට පන්තියේ දී අවස්ථාව සලසන්න.
- තනිව සතෙකු නිර්මාණය කළ නොහැකි සිසුන්ට ගුරුවරයාගේ යොමු කිරීම අනුව සතෙකු නිර්මාණය කිරීමට මඟ පෙන්වීම.

  උදා : කඩදාසි ගෙතුමෙන් මාළුවකු නිර්මාණය.

  - **A4** වර්ණ කඩදාසි 2ක් සපයා ගන්න. එම කඩදාසි දෙක එක මත එක තබා දික් අතට සමාන කොටස් තුනක් වන සේ නවාගෙන නැමුම් දාර ඔස්සේ කපා වෙන් කර ගන්න.
  - එම කොටස්වලින් එක් වර්ණයකින් එක බැගින් කොටස් දෙක එක මත එක තබා දෙකට නවන්න.
  - 2 රූපයේ දක්වා ඇති ආකාරයට නැමුම් දාරයේ සිට සෙ.මී. 5ක් පමණ දුරින් රේඛාවක් සලකුණු කර ඒ දක්වා නැමුම් දාරයේ සිට තීරු 5ක් පමණ කපා ගන්න.




- ඉන් පසු කැපූ කඩදාසි කොළ වෙන් කර ගන්න. (රූපය 3) තීරු එකක් තුළින් අනෙක දමමින් රූපය 4, 5, 6 හි දැක්වෙන ආකාරයට එය සකස් කර ගන්න.



4 5 6

- පසුව ඊතලයකින් පෙන්නුම් කර ඇති ස්ථානය තුළින් පුළුන් වැනි ද්‍රව්‍යයකින් ඇතුළත පුරවා ගන්න.
- මෙය මාළුවාගේ බඩ ආකාරයට සකස් කර ගන්නා කොටසයි.



7

- මාළුවාගේ වරල කොටස ද රූපය 7හි දක්වා ඇති ආකාරයට කැමති හැඩයකට කපා අලංකාර කර ගන්න.
- පිටුපස වරල සේ කඩදාසි කොටසක් කපා එය ද සුදුසු පරිදි අලවන්න.

▪ මේ ආකාරයට ඉවත ලන ද්‍රව්‍ය, ගොක් කොළ, ශාක පත්‍ර, ශාක කොටස් යොදා ගනිමින් කරන ලද සත්ත්ව රූප නිර්මාණ සහිත පන්ති ප්‍රදර්ශනයක් දෙමාපිය සහභාගීත්වය සහිතව පන්ති කව දිනයක පවත්වන්න.

▪ සිසු නිර්මාණ අගය කිරීමට දෙමාපියන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 7.

- පහත දක්වා ඇති ආකාරයේ ගුණාංග, සත්ත්ව චර්යා මඟින් නිරූපණය වන අවස්ථා භූමිකා රංගන මඟින් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
    - සාමූහික බව.
    - එකිනෙකාට පිහිට වීම........ වැනි.

- එම ඉදිරිපත් කිරීම් ආශ්‍රයෙන්, එවැනි යහගුණ පවත්වා ගැනීම මඟින් එම සතුන්ට අත්වන ප්‍රයෝජන පිළිබඳ ව කතාබහ කරන්න.

- එසේ ම එම ගුණාංග මඟින් අපට ලබාගත හැකි ආදර්ශ පිළිබඳව ද සිසු අවධානය යොමු කරන්න.

- සතුන්ගෙන් අපට ලැබෙන ප්‍රයෝජන පිළිබඳව ද මෙම කතාබහ තුළ දී අවධානය යොමු කරමින් ඒ හා සම්බන්ධ ව ලියවී ඇති කවි, ගී ගායනයට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදා :- බැරි බර කරේ තියන් - දෙපයට වාරු අරන්

  අපෙ බඩ කට පුරවනවා

  රෑ සී පද කියමින් - සීතලයට ගැහෙමින්

  හපුතලෙ කන්ද නඟිනවා.....

  ගායනය - මැක්සි ජයවීර

සැකසුම :- එච්.එම්. සුධර්මිකා ගුණතුංග
කෑ/මාව/ බැමිණිවත්ත ම.වි.
මාවනැල්ල අධ්‍යාපන කලාපය